# 2 වන දවස

## ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි

දෙවියන් වහන්සේට ''අබ්බා'' කියා ඇමතීමට ක්‍රිස්තුන් වහන්සේ අපට ද ආරාධනා කරති.

ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේට අබ්බා කියා ආමන්ත්‍රණය කළා පමණක් නොව, අපට ද එසේ ආමන්ත්‍රණය කිරීමට ආරාධනා කරති. එහෙයින් මෙසේ යාච්ඤා කරන්න. ''ස්වර්ගයෙහි වැඩ වසන අපගේ පියාණෙනි ............''

(ශු. මතෙව් 6:9)

''තවද ඔබ පුත්‍රයාණන් බව ඔප්පු කරන පිණිස ''අබ්බා පියාණෙනි'' කියා හඬ ගසන තම පුත්‍රයාණන්ගේ ආත්මය දෙවියන් වහන්සේ අපේ සිත් වලට එවා වදාළ සේක.'' (ගලාති 4:6) අපි සෑම දෙනෙක් ම එලෙස ම ක්‍රිස්තුන් වහන්සේ තුළ දේව පුත්‍රයෝ වම්හ. අප යාච්ඤා කරන්නේ අපගේ ම ආදර තාත්තාට ය. මේ සත්‍යතාවයට අද දවස පුරා අවදි වෙමු. කුඩා දරුවෙක් තම තාත්තාගේ තුරුලේ සිටිමින් ඔහු සමඟ කතා කර කර සිටිනවා සේ අපත් ආදර දේව තාත්තා සමඟ කතා කරමු. යාච්ඤා කරමු.

**දවස පුරා :-** ✵ ඔබව දේව තාත්තාගේ තුරුලට රැගෙන යන්නට කියා ශුද්ධාත්මයාණන් වහන්සේට ආයාචනා කරන්න. ඔබ මේ දැන් තාත්තාගේ තුරුලේ සිටින බව විශ්වාසයේ ඇසින් දැක එය අයිති කර ගන්න. මෙම අභ්‍යාසයට දවස පුරා ම ඇතුළු වන්න.

✵ ගීය : අබ්බා අබ්බා පියාණෙනි ............ ///
අබ්බා අපේ පියාණෙනි ............